**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශා ස්ත්‍රවේදී උපා ධි (බා හිර - නව නිර්දේශය-පරීක්ෂණය 300 මට්ටම - මාර්තු - 2025**

**இளங்கலைமாணிப் பட்ட பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்) 300 வது தேர்ச்சி மட்டம் – மார்ச் – 2025**

**Bachelor of Arts (External - New Syllabus) Examination 300 Level - March - 2025**

## SUPE 306

## උරුම සංචාරක ව්‍යාපාරය/ Heritage Tourism

කාලය පැය (03) තුනයි.
**(மூன்று) 03) மணித்தியாலங்கள்**
Time three **(03)** Hours.

ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
**5 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.**
Answer 5 questions only.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
**எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.**
Marks will be deducted for illegible hand writing.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 8 කි.
**இந்த வினாப்பத்திரத்தில் 8 வினாக்கள் உள்ளன.**
There are 8 questions in the question paper.

---

1. පහත මාතෘකා පිළිබඳ සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
   i. ස්පර්ශනීය සහ අස්පර්ශනීය උරුමය
   ii. චංචල සහ නිශ්චල උරුමය
   iii. සංස්කෘතික සහ ස්වාභාවික උරුමය
   iv. යුනෙස්කෝ ලෝක උරුමය

2. සංචාරක ව්‍යාපාරය සහ උරුම සංචාරක ව්‍යාපාරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. සංචාරක ව්‍යාපාරය නිර්වචනය කරන්න.
   ii. උරුම සංචාරක ව්‍යාපාරය යනු කුමක්දැයි පැහැදිලි කොට උරුම සංචාරක ව්‍යාපාරයේ විවිධ වර්ග කෙටියෙන් විස්තර කරන්න.
   iii. සංවර්ධනය වෙමින් පවතින රටවලට උරුම සංචාරක ව්‍යාපාරයේ ඇති ප්‍රතිලාභ පිළිබඳ සාකච්ඡා කරන්න.

3. සංචාරක ආකර්ෂණ ස්ථාන ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. සංචාරක ආකර්ෂණ ස්ථානයක් යනු කුමක්දැයි සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
   ii. සාර්ථක සංචාරක ආකර්ෂණ ස්ථානයක ලක්ෂණ මොනවාද?
   iii. සංචාරක ආකර්ෂණ ස්ථාන කළමනාකරණය කිරීම සඳහා උරුම අලෙවිකරණය සහ සැලසුම්කරණය වැදගත්වන්නේ මන්දැයි සාකච්ඡා කරන්න.

4. උරුම සංරක්ෂණය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. උරුම සංරක්ෂණය නිර්වචනය කරන්න.
   ii. උරුම සංරක්ෂණයේ විවිධ මට්ටම් මොනවාද?
   iii. උරුම සංරක්ෂණයේ මූලධර්ම සහ ආචාරධර්ම සාකච්ඡා කරන්න.

5. කෞතුකාගාර ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. කෞතුකාගාරයක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
   ii. විවිධ කෞතුකාගාර වර්ග මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
   iii. උරුම සංචාරක ව්‍යාපාරයට කෞතුකාගාරවල දායකත්වය සාකච්ඡා කරන්න.

6. ශ්‍රී ලංකාවේ උරුම සංචාරක ව්‍යාපාරයේ ධනාත්මක සහ ඍණාත්මක බලපෑම විශ්ලේෂණය කරන්න.

7. උරුම සංචාරක ව්‍යාපාරයේ සමකාලීන අභියෝග සහ ප්‍රවණතා පිළිබඳ සුදුසු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

8. පහත මාතෘකා **හතර (04)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   i. උරුම සන්නාමකරණය (heritage branding)
   ii. උරුම අලෙවිකරණය
   iii. උරුමය වෙළඳභාණ්ඩකරණය වීම සහ වේදිකාගත සත්‍යතාව (commodification of heritage and stage authenticity)
   iv. උරුම සංචාරක ව්‍යාපාරයේ ඉහිලුම් ධාරිතාව (carrying capacity in heritage tourism)

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින්)